# 2022 ජනවාරි මාසයට අදාලව 2022.01.20 දින පවත් වන ලද
# බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2022.01.20
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගීත්වය** -

| | |
|---|---|
| 01. ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා | - ගරු සභාපති |
| 02. එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. එම්.ඒ. උබේසේන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. බී. විල්මට් සිල්වා මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 08. බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 10. එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 11. ඩී.එම්. කරුණාවතී මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 12. ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 13. ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 14. එච්.එම්. සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 15. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |

## පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

2021.12.28 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2022.01.13 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා සභාවට දන්වන ලදි.

එහිදි ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් 2021.12.28 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

## පසුගිය මාසයේ විශේෂ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

2021.12.15 දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2022.01.13 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්ථාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා සභාවට දන්වන ලදි.

එහිදී ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා පසුගිය මස විශේෂ සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් 2021.12.15 දිනැති විශේෂ සභා වාර්තාව සභා සම්මත විය.

## 02. <u>ගරු සභාපතිතුමා විසින් කරනු ලැබූ විශේෂ නිවේදන</u>.

## <u>2.1. 2021 දෙසැම්බර් මාසය තුල කොවිඩ් ප්‍රතිකාර මෙහෙයුම් මධ්‍යස්ථානය සම්බන්ධවයි.</u>

2021 දෙසැම්බර් මාසය තුල කොවිඩ් ප්‍රතිකාර මෙහෙයුම් මධ්‍යස්ථානය හරහා බිබිල ප්‍රදේශයේ නිවෙස් වල නිරෝධායනය වන ආසාධිත කොවිඩ් රෝගීන් 153කට අවශ්‍ය ආයුර්වේද ඖෂධ හා ප්‍රතිශක්ති වර්ධක ඖෂධ ඔවුන්ගේ නිවෙස් වෙතටම ලබාදුන් රෝගීන්ගේ ලේඛනය පහත දැක්වේ.

| දිනය | රෝගීන් ප්‍රමාණය |
|---|---|
| 2021.12.02 | 72 |
| 2021.12.06 | 12 |
| 2021.12.07 | 12 |
| 2021.12.08 | 08 |
| 2021.12.13 | 28 |
| 2021.12.15 | 02 |
| 2021.12.17 | 05 |
| 2021.12.20 | 03 |
| 2021.12.21 | 06 |
| 2021.12.22 | 02 |
| 2021.12.24 | 03 |
| **මුළු එකතුව** | **153** |

පුද්ගල ශරීරය තුල ප්‍රතිශක්තිය ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම අරමුණු කරගෙන දෙසැම්බර් මාස තුල පමණක් සුවධරණී පේයාව කි.ග්‍රෑ.04ක ප්‍රමාණයක් බෙදා දෙන ලදී.තවදුරටත් කොවිඩ් පසු ප්‍රතිකාර සායන හරහා ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන් හටද ආයුර්වේද ප්‍රතිකාර හරහා මහත් සුවයක් ලැබී ඇත.

අපගේ ප්‍රතිකාර මෙහෙයුම් මධ්‍යස්ථානය හරහා ප්‍රතිකාර ලබා දුන් සියළුම කොවිඩ් ආසාධිත රෝගීන්ගේ දත්ත පරිගණක ගත කරමින් පවතින බව නිවේදනය කළේය.

## <u>2.2. ග්‍රාමීය පාලම් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය</u> .

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ "සෞභාග්‍ය දැක්ම" ප්‍රත්පත්ති මාලාව ක්‍රියාත්මක කරමින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ කෙටි කාලයක් තුල කුඩා පාලම් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියක් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ අවධානම යොමු වී ඇති බැවින් ඒ සඳහා මන්ත්‍රීවරුන්ගේ බල ප්‍රදේශවල අබලන් වී ඇති ග්‍රාමීය පාලම් ඇත්නම් ඒවා සොයාබලා අවශ්‍ය අලුත්වැඩියා කිරීමට එම හඳුනාගත් ස්ථාන පෙබරවාරි 15 වැනිදාට පෙර මෙහි ඇති ආකෘතිය අනුව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස නිවේදනය කළේය.

## 03 .ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

### ගරු උප සභාපති එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා

බිබිල,කොටගම,මුදියල,74/1 ලිපිනයේ පදිංචි ආර්.බී.කාවින්ද සඳමාල් ඇතුළු ගම් වාසීන් විසින් මුදියල ප්‍රදේශයේ පිහිටි ආයුර්වේද පෙර පාසල් ගොඩනැගිල්ලේ ගමේ තරුණ පිරිස් හා පිටස්තර පුද්ගලයින් පැමිණ රාත්‍රී කාලයේ දී මත්පැන් හා නොයෙකුත් අකටයුතුකම් සිදු කරන බැවින් දැනට මෙම ගොඩනැගිල්ල අභාවයට පත්වෙමින් යන බැවින් ඒ සඳහා මෙම ගොඩනැගිල්ල ආසන්නයේ පදිංචි අයෙකු මුරකරුවෙකු ලෙස පත් කර මෙම ගොඩනැගිල්ල සුරක්ෂිත කර දෙන මෙන් ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු උප සභාපති එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා විසින් සභාගත කරන ලදි.

### ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා

බිබිල,කිවුලපිටලන්ද පදිංචි ගම්වාසීන් විසින් අබ්බුන්නා කඳුර හරහා ඉදි කර තිබූ පරණ බෝක්කුව එක් පැත්තක් ගිලා බැස ඇති අතර එය ඉක්මනින් පිළිසකර කිරීමක් හෝ තාවකාලික පස් හෝ බොරළු පිරවීමක් සිදු කර දෙන මෙන් ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් සභාගත කරන ලදි.

බිබිල,කිවුලපිටලන්ද පදිංචි ගම්වාසීන් විසින් බිබිල පොළ භූමිය සංවර්ධනය කටයුතු නිසා ගමට පිවිසෙන ප්‍රධාන මාර්ගය අවහිර වන ලෙස වෙළදාම් කිරීම හා වාහන නවතා තිබීම කරදරකාරී ලෙස සිදු වීම නිසා ගම්වාසීන් හා පාසල් දරුවන් මහත් පීඩනයකට ලක් වී ඇති බවත් මාර්ගය නිරවුල් කර දෙන මෙන් ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපියද ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් සභාගත කරන ලදි.

## 04.යථාපරිදි කල්දි ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 05.යථාපරිදි කල්දි ඇති යෝජනා.

## 05.01.ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමාගේ යෝජනා.

## 05.01.01. දෛනික දීමනාවක් ලබා ගැනිම සම්බන්ධවයි.

බිබිල හා රදලියද්ද ප්‍රාදේශීය සභා පෙරපාසල් පාලිකාවන් සමඟ බිබිල හා රදලියද්ද ප්‍රාදේශීය සභා පෙරපාසල්වල ස්වේච්ඡා ගුරුවරුන් ලෙස වසර ගණනාවක සිට සේවය කරන බවත් ඒ සඳහා එහි සිටින ගුරුවරුන් සියලු දෙනා සුදුසුකම් සපුරා ඇති බවත් ඔවුන්ට දෛනික දිමනාවක් ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීම් සලකා බලා දීමනාව ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී බිබිල පෙර පාසලට සම්බන්ධව සේවය කරන හතරදෙනාටත් රදලියද්ද පෙරපාසලේ සේවය කරන දෙදෙනාටත් කම්කරු වැටුපක් ලෙස මාසයකට දින හතරක් ගෙවීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

බිබිල පෙර පාසලට සම්බන්ධව සේවය කරන හතරදෙනාටත් රදලියද්ද පෙරපාසලේ සේවය කරන දෙදෙනාටත් කම්කරු වැටුපක් ලෙස මාසයකට දින හතරක් ගෙවීම සුදුසු බවට තීරණය විය.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.02.බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල පොදු වෙළඳපලේ A ශ්‍රේණියේ අංක 10 දරණ කඩකාමරයේ බදු අයිතිය පවරා දීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල පොදු වෙළඳපලේ A ශ්‍රේණියේ අංක 10 දරණ කඩකාමරය බදුගෙන සිටි බිබිල, කණුල්වෙල, මඩිප්පලම්මුල්ල පාර ලිපිනයේ පදිංචි ඩී.එම්.ගුණසේකර මයා මියගොස් ඇති බැවින් ඔහුගේ බිරිඳ හා ගැහැණු දරුවන් දෙදෙනා බිබිල, කණුල්වෙල, මඩිප්පලම්මුල්ල පාර ලිපිනයේ පදිංචි කේ.අනෝමා පෙරේරා මහත්මිය, ඩී.එම්.නවෝද්‍යා හංසනී ගුණසේකර හා ඩී.එම්.ගිහානි කව්ශ්කා ගුණසේකර යන අය එම කඩකාමරය බිබිල,වැගම,තුඹලේරුව යන ලිපිනයේ පදිංචි ජේ.ඒ. අනුර ශාන්ත යන අයට පවරා දීමට කැමැත්ත දිවුරුම් ප්‍රකාශයකින් ලබා දී ඇති අතර එම කඩකාමරයේ නම සංශෝධනය කර ජේ.ඒ. අනුර ශාන්ත යන නමට පවරා දෙන මෙන් ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් අදාල පැවරුම් ගාස්තුව අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.03.WP PF – 7391 නිල රථය වෙනුවෙන් වැයවූ අමතර ඉන්ධන ප්‍රමාණය අනුමත කර ගැනිම.</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා වශයෙන් බල ප්‍රදේශය තුල මෙන්ම ඉන් පිටතද විවිධ කාරණා සඳහා WP PF- 7391 දරණ නිල රථයෙන් ගමන් කිරීමට සිදුවිය. එසේම වැඩ අධිකාරි

හා සභා ලේකම්ද පූර්ව අවසරය ඇතිව විවිධ රාජකාරි ගමන් සඳහා මෙම නිල රථය භාවිතා කොට ඇති බැවින් 2021 අගෝස්තු, ඔක්තෝම්බර්, නොවැම්බර්, දෙසැම්බර් යන මාසයන්හි එසේ ගමන් කල නිල ගමන් වාර වෙනුවෙන් සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 653.375 ක් ලබා ගැනීමට සිදු වු බැවින් ඒ සඳහා වැයවු මුදල සභා අරමුදලින් ගෙවීමට අනුමැතිය ලබාදිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| මාසය හා වර්ෂය | වැයවු ඉන්ධන ප්‍රමාණය ලීටර් | අනුමත ඉන්ධන ප්‍රමාණය ලීටර් | වැඩිපුර වැයවු ඉන්ධන ප්‍රමාණය ලීටර් | ඩීසල් ප්‍රමාණය වැඩිවීමට හේතු |
|---|---|---|---|---|
| 2021- අගෝස්තු | 411.75 | 400 | 11.75 | 2021.08.03 - කොළඹ- පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ ගම සමඟ පිළිසඳර වැඩසටහනට යෝජිත බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ව්‍යාපෘති සඳහා සංශෝධිත ඇස්තමේන්තු රැගෙන යාම. කාර්මික නිළධාරි |
| ඔක්තෝම්බර් | 415.125 | 400 | 15.125 | 2021.10.04- කොළඹ- පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ ගම සමඟ පිළිසඳර වැඩසටහනට යෝජිත බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ව්‍යාපෘති වල අත්තිකාරම් මුදල් ලබා ගැනීමට යාම. වැඩ අධිකාරී |
| නොවැම්බර් | 610.125 | 400 | 210.125 | 2021.11.18, 19 - අනුරාධපුරයේ ජනාධිපති තුමා සමඟ පැවැති විශේෂ සාකච්ඡාවට සහභාගිවීම. - සභාපති තුමා<br><br>2021.11.23 - වයඹ පළාත්සභාව - කාර්යාල ජාලගත පද්ධතිය පිළිබඳ තොරතුරු සාකච්ඡාවට යාම. සභාපති තුමා<br><br>2021. 11. 30- කොළඹ පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලීය ප්‍රධාන ශ්‍රවනාගාරයේ පැවැති මහජන පුස්තකාල ඩිජිටල් හා ස්වංක්‍රීය කරණ ව්‍යාපෘතියේ පළමු අධියරේ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට යාම. සභාපතිතුමා හා සභා ලේකම් |
| දෙසැම්බර් | 816.375 | 400 | 416.375 | 2021.12.05 - බදුල්ල පළාත් පාලන හා ඉංජිනේරු කාර්යාලයට යාම. සභාපති තුමා<br><br>2021.12.07 - බුත්තල කසල අංගනය හා කොම්පෝස්ට් අංගනය විවෘතයට යාම. සභාපති තුමා.<br>2021.12.08,09,10- කොළඹ ලයා හෝටලයේ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පැවැති පළාත් පාලන ආයතන වල පැවැති මහජන නියෝජිතයින්ගේ විශේෂ වැඩමුළුවට සහභාගිවීම.<br>ගරු මන්ත්‍රී බී. විල්බට් සිල්වා<br>ගරු මන්ත්‍රී කේ. එම්. කපිල විජේසූරිය<br><br>2021.12.13 - බදුල්ල විගණන කාර්යාලයට හා ආණ්ඩුකාරවර කාර්යාලයට යාම. සභාපති තුමා.<br><br>2021.12.17 - බදුල්ල පළාත් පාලන හා පළාත් සභාවට යාම. සභාපති තුමා<br>2021.12.21, - කොළඹ පළාත් පාලන අමාත්‍යාංශයට යාම, මුදල් අමාත්‍යාංශයට යාම, කැබ් රථයේ අලුත්වැඩියා කටයුත්තක් සඳහා යුනයිටඩ් මෝටස් ආයතනයට යාම. සභාපති තුමා.<br><br>2021.12.22 - කතරගම වනජීවී කාර්යාලය පුවක් පැලය කසල අංගනයේ අලිවැට සැකසීම පිළිබඳ සාකච්ජාවට යාම - සභාපති තුමා<br>2021.12.23 - බදුල්ල ආණ්ඩුකාරවර කාර්යාලයට යාම සභාපතිතුමා<br><br>2021.12.24, 25 - බදුල්ල පළාත් පාලන අමාත්‍යාංශයට යාම හා කොළඹ පළාත් පාලන අමාත්‍යාංශයට ගම සමඟ පිළිසඳර වැඩසටහනෙහි ව්‍යාපෘති වල බිල්පත් රැගෙනයාම. ලේකම් තුමා |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලිඛිතව ඉදිරිපත් වී ඇත්නම් පමණක් එයට එකඟ වන බවත් එසේ නොමැති නම් එයට අකමැති බව ආර්.බී. අත්තනායක මැතිතුමා , බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා , ගරු උප සභාපති එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා හා එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා ප්‍රකාශ කල අතර අනෙක් මන්ත්‍රීවරුන් එකඟතාවය ලබා දෙන බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලිඛිතව ඉදිරිපත් වී ඇත්නම් පමණක් එයට එකඟ වන බවත් එසේ නොමැති නම් එයට අකමැති බව ආර්.බී. අත්තනායක මැතිතුමා ,

බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා, ගරු උප සභාපති එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා හා එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා තීරණය කල අතර අනෙක් මන්ත්‍රීවරුන් එකඟතාවය ලබා දෙන බවට තීරණය කරන ලදී.
ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සඳහා මන්ත්‍රි මණ්ඩලයේ බහුතර එකඟතාවය හිමිවුයෙන් යෝජනාව බහුතරයේ කැමැත්තෙන් සභා සම්මත විය.

## 05.01.04.2021 දෙසැම්බර් මාසය සඳහා බිබිල කොට්ඨාශය තුල මෝටර්ග්‍රේඩර් යන්ත්‍රය යොදා කරනු ලැබූ සංවර්ධන කටයුතු වල ආදායම

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ZA- 5419 අංක දරණ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය 2021 දෙසැම්බර් මාසය තුල කුලී පදනම මත පැය 35.3 ක් සේවයේ යොදවා ඇති බවත්, ඒ සඳහා රු.141200.00 ක ආදායමක් උපයාගෙන ඇති බැවින් සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.05.බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වාහන හා යන්ත්‍ර සූත්‍ර වාර්ෂිකව රක්ෂණය කිරීම.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් වාහන හා යන්ත්‍රසූත්‍ර වාර්ෂිකව ජාතික රක්ෂණභාර අරමුදල යන ආයතනයේ රක්ෂණය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. 252 - 6355 කැබ් රථය
02. UP LL - 7517 කෘෘකැබ් රථය
03. UP ZA – 5164 බැකෝ ලෝඩර් යන්ත්‍රය
04. UP ZA – 5419 මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය
05. UP RD – 8046 ට්‍රැක්ටරය
06. UP RX – 2181 ටේලරය
07. UP RB – 4989 ට්‍රැක්ටරය
08. UP RV – 8718 ටේලරය
09. 49 – 9912 – ට්‍රැක්ටරය
10. 67 – 1724 – ටේලරය
11. UP LL – 6930 ටිපර් රථය
12. UP RX – 9034 ටේලරය
13. UP RY – 5342 ගලිබවුසරය
14. UP RX – 0326 ජල බවුසරය
15. UP RX – 2044 ජල බවුසරය
16. UP RX – 1233 ජල බවුසරය
17. UP RX – 8364 ජල බවුසරය

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.06.මාළු වෙළඳපලෙහි වෙළදාම් කිරිම සම්න්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් මාළු වෙළඳපොලවල් බදු ගෙන ඇති බදුකරුවන් අසාධු ලේඛනයේ නම් සඳහන් අයවලුන් යොදවා ව්‍යාපාර කටයුතු කරන බව වාර්තා වන අතර එය බදු ගිවිසුමට පටහැනි බවත් අසාධු ලේඛනයේ සිටින පිරිස් එම ස්ථානයේ ව්‍යාපාර කරන බවට තොරතුරු අප ආයතනයේ නිලධාරියෙක් යොදවා වාර්තාවක් ලබා ගෙන එම වෙළඳසැල් සීල් තබා ගිවිසුම අවලංගු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී අසාධු ලේඛනයේ සිටින පිරිස් එම ස්ථානයේ ව්‍යාපාර කරන බවට තොරතුරු අප ආයතනයේ නිලධාරියෙක් යොදවා වාර්තාවක් ලබා ගෙන එම වාර්තාව පොලිසියට ඉදිරිපත් කිරීමටත් එය සනාථ කර ගැනීමට හැකි වුවහොත් සීල් තබා තැන්පත් කළ මුදල හා මාළු වෙළඳපොල සභාව සතු කර ගැනිමටත් හිඟ මුදල් අයකර ගැනීමටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අසාධු ලේඛනයේ සිටින පිරිස් එම ස්ථානයේ ව්‍යාපාර කරන බවට තොරතුරු අප ආයතනයේ නිලධාරියෙක් යොදවා වාර්තාවක් ලබා ගෙන එම වාර්තාව පොලිසියට ඉදිරිපත් කිරීමටත් එය සනාථ කර ගැනීමට හැකි වුවහොත් සීල් තබා තැන්පත් කළ මුදල හා මාළු වෙළඳපොල සභාව සතු කර ගැනිමටත් හිඟ මුදල් අයකර ගැනීමටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.07.හෙල බොජුන්හලේ ආහාර සකස් කරන්නන් පුහුණු කිරීම සම්බන්ධවයි.

හෙල බොජුන්හලේ ආහාර සැකසීම සඳහා අවස්ථා ඉල්ලා ඇති අයගේ ඉල්ලීම් සලකා බලා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත පුහුණුව සඳහා යොමු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.( අදාල නාම ලේඛනය මේ සමඟ ඉදිරිපත් කර ඇත.)

ඇමුණුම් 01

| අනු අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 01 | ඒ.එම්.චන්ද්‍රිකා පොඩිමැනිකේ මිය | මොනරාගල පාර, 01 කණුව, මැදලන්දවත්ත, බිබිල |
| 02 | ආර්.බී.චන්ද්‍රාකුමාරි මිය | අලුත් පාර, නාගල, බිබිල |
| 03 | ඩී.එම්.ලක්ෂිකා ධනංජනී මිය | තලගහවත්ත, හෙවෙල්වෙල,බිබිල |
| 04 | නන්දාවතී මිය | 02 කණුව,දෙල්කැටිය,බිබිල |
| 05 | ඒ.එම්.කුසුම් දයාලතා මිය | දියකොලේයාය,බදුල්ලගම්මන,බිබිල |
| 06 | ජේ.එම්.ජේමාවතී මිය | අමුණුදෝව,තානායම්ගම,යල්කුඹුර |
| 07 | එච්.එම්.පද්මසීලි මිය | අංක 66,කොටගම,බිබිල |
| 08 | ඩී.එම්.එස්.මැණිකේ මිය | ශ්‍රී ධම්මපාල මාවත,වැගම,බිබිල |
| 09 | ර්.ඒ.ශ්‍රියානි කාන්තිලතා මිය | කැබැල්ලකැටිය පාර,උඩබුබුල,බිබිල |
| 10 | එච්.එම්.එන්.පී.පී.කුමාරි මිය | ගුණසිරි නිවස,අඹගොල්ල,බිබිල |
| 11 | එච්.එම්.සුනේත්‍රා මල්කාන්ති මිය | කපුහේනේ වත්ත,අඹගොල්ලවත්ත,බිබිල |
| 12 | පී.එම්.සිසිර ලතා මැණිකේ මිය | අංක 112, ධීවර ගම්මානය, සිකුරාලන්ද,නාගල,බිබිල |
| 13 | සිරියලතා මිය | කොකටියගහමුල්ල,අඹකැටිය,බිබිල |
| 14 | ඩී.එම්.ඉන්ද්‍රානී රේණුකා මැණිකේ මිය | ධීවර ගම්මානය,අංක 130,සිකුරාලන්ද,නාගල, බිබිල |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී දැනට ඉදිරිපත් වී ඇති අයදුම්කරුවන් 14 දෙනාට අමතරව තවත් 06 දෙනෙකු සම්බන්ධ කර හෙලබොජුන් හල සඳහා සේවකයින් 20 දෙනෙකු බඳවා ගැනීමටත් ඔවුන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණුවක් ලබා දීම සුදුසු බවත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජ්. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

දැනට ඉදිරිපත් වී ඇති අයදුම්කරුවන් 14 දෙනාට අමතරව තවත් 06 දෙනෙකු සම්බන්ධ කර හෙලබොජුන් හල සඳහා සේවකයින් 20 දෙනෙකු බඳවා ගැනීමටත් ඔවුන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණුවක් ලබා දීම සුදුසු බවත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.ජංගම වෙළඳකුටි සම්බන්ධවයි.

ජංගම වෙළඳකුටි 30 ක් සකස් කර ඇති අතර ඉන් කුටි 20ක් නගරයට ද කුටි 10ක් නගරයෙන් පිටත වෙළඳුන් සඳහා ද ලබා දීමට තීරණය කර ඇති අතර ඒ සඳහා තෝරාගත් අයගේ නාම ලේඛනය ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි. (අදාල නාම ලේඛනය මේ සමඟ ඉදිරිපත් කර ඇත.)

ඇමුණුම් 02

| අනු අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 01 | කේ.ජී.වසන්ත ලාල් මයා | ලිඳකුඹුර, බිබිල |
| 02 | ඒ.එම්.කුලසිරි අබේවික්‍රම මයා | උඩකිවුල,උණගොල්ල, බිබිල |
| 03 | ඒ.ඩී.ප්‍රියලාල් තිලකසිරි ගුණරත්න මයා | හැපොල,දියකොබල,බිබිල |
| 04 | ඩී.එම්.ගුණසේන මයා | 15/C,උණගොල්ල,බිබිල |
| 05 | ඩබ්.එම්.ගුණරත්න මයා | අඹවත්ත,හෙවෙල්වෙල,බිබිල |
| 06 | පී.එම්.සුමනාවතී මිය | කැබැල්ලකැටිය,උඩ බුබුල,බිබිල |

| | | |
|---|---|---|
| 07 | ප්‍රියන්ත එදිරිසිංහ මයා | පංසල අසල,රදලියද්ද,බිබිල |
| 08 | ඩී.එම්.ධර්මසිරි මයා | පාසල අසල,දොඩම්ගොල්ල,බිබිල |
| 09 | එස්.ඩී.සරෝජා දේවී මිය | තුඹලේරුව වැගම,බිබිල |
| 10 | එම්.නිශාන්ති මිය | මහියංගන පාර,01 කණුව,බිබිල |
| 11 | ජේ.එම්.යසවතී මිය | දම්සිරිගම,පිටකුඹුර,බිබිල |
| 12 | ජේ.ජනක කැලුම් ජයසිංහ මයා | 05 කණුව,වෙලේවත්ත,පිටකුඹුර,බිබිල |
| 13 | ටී.එම්.ගයාන් ඉරෝෂන් | 02 කණුව,බිබිල |
| 14 | එල්.ඒ.බී.චිත්‍රා මිය | අංක 85,රතුපස්කැටිය,බිබිල |
| 15 | කේ.එම්.ගුනවතී මිය | දිඹුලමුල හේන,යල්කුඹුර,බිබිල |
| 16 | ර්.ඩී.රාජරත්න මයා | දම්පතිගම,බිබිල |
| 17 | ඩී.එම්.උපාලි දිසානායක මයා | වෙඩඩගෙදර වත්ත,01 කණුව,මොනරාගල පාර,බිබිල |
| 18 | ආර්.එම්.පුංචි බංඩා මයා | 3 කණුව,වැගම,බිබිල |
| 19 | එල්.ඒ.බි.කරුණාදාස මයා | ජයලත් නිවස,කවුඩැල්ල,බිබිල |
| 20 | ඩී.එම්.අනුලාවතී මිය | කනවේගල්ල,මධුරාඔය,බිබිල |
| 21 | බී.බී.හීංමැණිකා | මල්ලැහැව,දියකොබල,බිබිල |
| 22 | ඩබ්.එම්.කුසුමලතා මිය | ගොඩමඩේ වත්ත,ළිදකුඹුර,බිබිල |
| 23 | ඒ.එම්.කරුණාරත්න මයා | බදුවත්ත පාර,ඉළුකාපතන,බිබිල |
| 24 | ඒ.එම්.ජයසුන්දර මයා | ගල්කැටිය වත්ත,ඉලුකාපතන,බිබිල |
| 25 | සමන් අජිත් කුමාර මයා | කොලොන්කැටිය,ඉළුකාපතන,බිබිල |
| 26 | බී.සමතපාල මයා | බිබිල නගරය,බිබිල |
| 27 | එච්.එම්.සිරියාවතී මිය | සිරිසඟපුර මාවත,කිවුලපිටලන්ද,බිබිල |

| | | |
|---|---|---|
| 28 | ඩබ්.එම්.නදීකා ප්‍රියදර්ශනී මිය | ශාන්ත ප්‍රදෙශ,කරගහවෙල,දියකොබල,බිබිල |
| 29 | ඩී.එම්.ආරියවතී | 39 කණුව,රදලියද්ද,බිබිල |
| 30 | ඩී.එම්.සරත් මයා | පොරකටුව,රදලියද්ද,බිබිල |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී දැනට ව්‍යාපාර කරන වෙළදුන් සඳහා වෙළඳ කුටි ලබා දීමට කටයුතු කරන ලෙසත් නගරය අවලස්සන වන ආකාරයට ඉටිරෙදි ගසා පවත්වාගෙන යාමෙන් වලකින ලෙස වෙළදුන්ට උපදෙස් ලබා දිය යුතු බවත් එසේ කිරීමට හැකියාවක් නොමැති නම් නැවත එම වෙළඳ කුටි සභාවට පවරා දීමට කටයුතු කරන බව ඔවුන්ව දැනුවත් කළ යුතු බවත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

දැනට ව්‍යාපාර කරන වෙළදුන් සඳහා වෙළඳ කුටි ලබා දීමට කටයුතු කරන ලෙසත් නගරය අවලස්සන වන ආකාරයට ඉටිරෙදි ගසා පවත්වාගෙන යාමෙන් වලකින ලෙස වෙළදුන්ට උපදෙස් ලබා දිය යුතු බවත් එසේ කිරීමට හැකියාවක් නොමැති නම් නැවත එම වෙළඳ කුටි සභාවට පවරා දීමට කටයුතු කරන බව ඔවුන්ව දැනුවත් කළ යුතු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.09.කොම්පොස්ට් අංගනය සඳහා සේවකයින් බඳවා ගැනීම සම්බන්ධවයි.</u>

පළාත් මට්ටමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ආරම්භ කරන ලද කොම්පොස්ට් අංගනයේ වැඩ කටයුතු සඳහා සේවකයින් හතර දෙනෙකු යොදවා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කොම්පොස්ට් අංගනයේ වැඩ කටයුතු සඳහා පුහුණුවක් ලබා ගැනීමට අවශ්‍ය සහය ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයෙන් ලබා ගැනීමට හැකි බවත් අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා රථයක් (මහේන්ද්‍රා ට්‍රක් රථයක්) අත්‍යවශ්‍ය බැවින් එය ලබා ගැනීම සුදුසු බවත් කොම්පොස්ට් අංගනයට අවශ්‍ය ඇල්බීසියා හා මානම් වැනි අමුද්‍රව්‍ය කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධ කර ලබා ගැනිමටත් සේවකයින් හතර දෙනෙකු යොදවා ගැනීම සුදුසු බවත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රි ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කොම්පොස්ට් අංගනයේ වැඩ කටයුතු සඳහා පුහුණුවක් ලබා ගැනීමට අවශ්‍ය සහය ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයෙන් ලබා ගැනීමට හැකි බවත් ප්‍රවාහනය සඳහා රථයක් (මහේන්ද්‍රා ට්‍රක්) අත්‍යවශ්‍ය බැවින් එය ලබා ගැනීම සුදුසු බවත් කොම්පොස්ට් අංගනයට අවශ්‍ය ඇල්බීසියා හා මානම් වැනි දෑ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධව ලබා ගැනිමටත් සේවකයින් හතර දෙනෙකු යොදවා ගැනීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.10.බිබිල සතිපොල ii අදියර ක්‍රියාත්මක කිරීම.</u>

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත බිබිල සතිපොල ii අදියර සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදනයේ දී ඉදිරිපත් වී ඇති කොන්ත්‍රාත්කරු වන වික්‍රම කොන්ත්‍රාත් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මිල අප ඇස්තමේන්තුවට වඩා මිලියන 4.8ක් වැඩියෙන් ඉදිරිපත් කර ඇති අතර මේ සඳහා රු.ලක්ෂ 20ක් දක්වා සීමාවට යටත්ව සභා අරමුදලින් දැරීමටත් ඔහු සමඟ ගිවිසුම් ගතව ඉදිරි කටයුතු සිදු කිරීමටත් අනුමැතිය ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.11.පොදු වෙළඳපල B/36 කඩ කාමරය ඉවත් කර ගැනිම සම්බන්ධවයි.</u>

බිබිල,පොදු වෙළඳපල,B/36,බියුටි ග්‍රොසරි ලිපිනයේ පදිංචි බී.ඒ.නන්දදාස මහතා විසින් සභා තීරණයට අනුව 2022.01.15 දින සවස B/36 කඩකාමරය ගලවා ඉවත් කර ගැනීමට තීරණය කර ඇති අතර චෙක්පත් නිකුත් කර ණයට ලබා ගෙන ඇති භාණ්ඩ විශාල ප්‍රමාණයක් ඇති බැවින් එම භාණ්ඩ මෙම වෙළඳසැල ඉදිරිපිට ඇති කොටසෙහි තබා අලෙවි කිරීමට අවසරදෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීම සාධාරණ බැවින් තාවකාලිකව එය ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.12.LED ප්ලෑෂර් ලයිට් දෙකක් ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල,අඹගොල්ලහංදිය,සමාධි සංවිධානයේ සභාපති වන ටී.බී.සිරිවර්ධන මයා විසින් ඔවුන්ගේ ප්‍රදේශයේ පවතින සංවිධානයේ හදිසි අවස්ථාවලදී පරිහරණයට LED ප්ලෑෂර් ලයිට් දෙකක් අවශ්‍ය බැවින් එය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීම සාධාරණ බැවින් මිල ගණන් කැඳවා ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.13.ප්‍රජා මණ්ඩල පිහිටුවීම සම්බන්ධවයි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රජා මණ්ඩල 02ක් පිහිටුවා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී ප්‍රජා මණ්ඩල පිහිටුවීමට වැගම වසම හා පිටකුඹුර වසම සඳහා වසම් විස්ස විස්ස දෙකට බෙදී කටයුතු කිරීම සුදුසු බවටත් ii අදියරයක් පවතින බවත් එහිදී ද තවත් වසම්වලට ප්‍රජා මණ්ඩල පිහිටුවීමට හැකි බවත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ප්‍රජා මණ්ඩල පිහිටුවීමට වැගම වසම හා පිටකුඹුර වසම සඳහා වසම් විස්ස විස්ස දෙකට බෙදී කටයුතු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.14.බිබිල සතිපොල අංක E-05 දරණ කඩකාමරය පවරා දීම සම්බන්ධවයි.

බිබිල,මහියංගනපාර,01 කණුව ලිපිනයේ පදිංචි එස්.ජේ.එම්.සුමනාවතී කුමාරි හාමි මිය විසින් සති පොලේ අංක E-05 දරණ කඩකාමරය සඳහා මාසිකව බදු මුදල් ගෙවමින් පවත්වාගෙන යනු ලබන අතර ඇය රෝගී තත්වයෙන් පසුවන බැවින් එම කඩකාමරය ඇයගේ පුතා වන එම්.පී.ප්‍රියන්ත ප්‍රේමතිලක යන අයට පවරා දීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් එය පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී පවුලේ අයෙක්ට කඩකාමරයක් පවරා දීමේදී රු.5,000.00ක ගාස්තුවක් අය කිරීම සුදුසු බව සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පවුලේ අයෙක්ට කඩකාමරයක් පවරා දීමේදී රු.5,000.00ක ගාස්තුවක් අය කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.15. 2022 වර්ෂයේ සිංහල දෙමළ අළුත් අවුරුද්ද නිමිතිකර ගෙන අත්පන්දු ක්‍රීඩා තරඟයක් පැවැත්වීම.

2022 වර්ෂයේ සිංහල හා දෙමළ අළුත් අවුරුද්ද නිමිතිකර ගෙන පවත්වනු ලබන බක්මහ උළෙලට සමගාමීව ප්‍රධාන ක්‍රීඩාවක් වන අපගේ ජාතික ක්‍රීඩාව වූ අත්පන්දු තරඟාවලියක් පැවැත්වීම සුදුසු වේ. විශේෂයෙන් අපගේ තරුණ පරපුර දුරකථනය භාවිතයට යොමුවී පොදු වැදගත්කම්වලින් හෙබි සංස්කෘතික කටයුතු වලින් ඈත්වෙමින් නොයෙකුත් සමාජ විරෝධි ක්‍රියාවලට නැඹුරු වෙමින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීමට ඉඩ ඇති මෙම වක වානුව තුල ක්‍රීඩාව තුලින් ඔවුන් යහමඟට ගැනිම , ඔවුන් තුල ක්‍රීඩා කෞෂල්‍යා වැඩිදියුණු කිරිම, අපගේ සංස්කෘතිය කෙරෙහි ගෞරවය ඇති කරමින් ඒතුලින් ඔවුන් උද්දීපනය කිරීමේ අරමුණින් මෙම අත්පන්දු ක්‍රීඩා තරඟාවලිය පැවැත්වීමට අපේක්ෂා කරමි.

ඒ සඳහා බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති ග්‍රාම නිලධාරි වසම් තුල ලියාපදිංචි සියළුම ක්‍රීඩා හා යෞවන සමාජ අතර අත්පන්දු තරඟාවලියක් පැවැත්වීමටත් ඒ සඳහා සහභාගි වන සෑම කණ්ඩායමක් සඳහාම අත් පන්දුවක් හා දැලක් ලබා දිමටත් i ,ii,iii ස්ථාන ලබා ගන්නා කණ්ඩායම් සඳහා පිලිවෙලින් රු. 50,000.00 රු.30,000.00 රු.20,000.00 ක මුදල් ත්‍යාගයක්

ලබා දීමටත් මෙම තරඟාවලිය සඳහා සහභාගී වන සෑම කණ්ඩායමක්ම දිරිමත් කිරීම සඳහා අත්පන්දුවක් දැලක් මෙන්ම i ,ii,iii ස්ථාන ලබා ගන්නා කණ්ඩායම් සඳහා කුසලාන පිරිනැමීමට කටයුතු සූදානම් කර ඇත.

එම උත්සව කටයුතු සඳහා 603 යටතේ සැපයුම් හා උපකරණ සඳහා වෙන්කර ඇති මුදලින් රුපියල් ලක්ෂ හතරක මුදලක් (රු. 400,000.00 ක ඇස්තමේන්තු මුදල) වැය කිරීමටත් එම වියදම් ශීර්ෂයේ මුදල් ප්‍රමාණවත් නොවේ නම් 609 යටතේ සුභසාධන සේවා වියදම් ශීර්ෂයෙන් ලබා ගැනීමට කටයුතු සලසා දෙන ලෙසත් මෙම අත්පන්දු තරඟාවලිය පැවැත්වීමට සහා අරමුදලින් වියදම් දැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු යයි මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී වොලිබෝල් තරඟය අප්‍රේල් මස 20 වැනි දිනයෙන් පසු දිනක දී පැවැත්වීමටත් අවසාන තරගය බාලිකා විද්‍යාලයට යාබදව ඉදිවෙන වොලිබෝල් ක්‍රීඩා පිටියේ දී පැවැත්වීම සුදුසු බව සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමටත් වොලිබෝල් තරඟය අප්‍රේල් මස 20 වැනි දිනයෙන් පසු දිනක දී පැවැත්වීමටත් අවසාන තරගය බාලිකා විද්‍යාලයට යාබදව ඉදිවෙන වොලිබෝල් ක්‍රීඩා පිටියේ දී පැවැත්වීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.16.දොඩම්ගොල්ල කඩකාමරවලට අදාල වාර්තාව ඉදිරිපත් කිරීම සම්බන්ධවයි.</u>

පසු ගිය මාසික සභා රැස්වීමේ දී සාකච්ඡා කළ පරිදි දොඩම්ගොල්ල කඩකාමර 03 සම්බන්ධව විෂය භාර නිලධාරිහට වාර්තාවක් ලබා දෙන ලෙස දැන් වූ එම වාර්තාව ඉදිරිපත් කරමි.

2010.05.25 දින සභා රැස්වීමේ දී යෝජනා අංක 02 යටතේ රු 2500/-ක් බැගින් කීමනි මුදලක් ලබාගෙන මාසික කුලිය රු 500/- බැගින් අය කර දොඩම්ගොල්ල පදිංචි පහත 3 දෙනාට කඩ කාමර බදු දී ඇත.
01 ඒ එම් කමලාවතී
02 ඩී එම් අනුර කුමාර හෙට්ටිපොල
03 ඩී එම් විජේකෝන්
නමුත් මෙම තිදෙනාට බදු දුන් බදු ගිවිසුම් ගොනුවේ නැත

2010 සිට 2012 දක්වා බදු ගෙවා ඇත

- පසුව 2010 සිට 2012 දක්වා ගෙවීම් කර ඇතත් 2012 නොවැම්බර් මස 2016 ජුලි දක්වා ගෙවීම් කර නැත. එහි වටිනාකම හා ප්‍රමාද ගාස්තු පහත පරිදි වේ.

| කඩ කාමර | කාලය | කුලී මුදල | ප්‍රමාද ගාස්තු | එකතුව |
|---|---|---|---|---|
| 01 | 2012 නොවැම්බර් සිට 2016 ජුලි දක්වා කුලී මුදල | 22500.00 | 153,000.00 | 175,500.00 |
| 02. | 2012 නොවැම්බර් සිට 2016 ජුලි දක්වා කුලී මුදල | 22500.00 | 153,000.00 | 175,500.00 |
| 03 | 2012 නොවැම්බර් සිට 2016 ජුලි දක්වා කුලී මුදල | 22500.00 | 153,000.00 | 175,500.00 |
| එකතුව | | 67500.00 | 459000.00 | 526500.00 |

- මෙතරම් මුදලක් ගෙවීමට තිබුනත් මෙම කඩ කාමර මුද්‍රා තබා නැත. කඩ කාමර 03 සඳහාම කුලී මුදල රු 67500.00 ක් හා ප්‍රමාද ගාස්තු රු 459000.00 ක් ගෙවීමට ඇත.
- ඉන් අනතුරුව 2016.08.18 දින ඉහත නම් සඳහන් අයට කඩ කාමර අවශ්‍ය නොවන බව පවසා නැවත සභාවට පවරා ගන්නා ලෙස ලිපි ඉදිරිපත් කර ඇත. එවිට සිටි ලේකම් තුමා හිඟ මුදල් ගෙවන ලෙස දන්වා ඇත. එම ලිපියද 2016.08.18 දිනැති වේ. හිඟ මුදල් වලින් කුලී මුදල වන රු 67500.00 ගෙවා ඇත. ප්‍රමාද ගාස්තු කොටස් වශයෙන් ගෙවන ලෙස දන්වා ඇත. එහෙත් එම මුදල් ගෙවීමකින් තොරව 2016.08.18 දන ඉහත නම් සඳහන් කඩ කාමර හිමියන්ගේ ගිවිසුම් අහෝසි කර ඇත. ප්‍රමාද ගාස්තු ලෙස රජයට සිදු වූ පාඩුව අය කර නැත.
- 2016.08.18 දිනම සභාවේ පැවති කළමණාකරණ කමිටුවට යොජනාවක් ඉදිරිපත් කර මෙම කඩ කාමර නැවත ටෙන්ඩර් කිරීමට තීරණය කර ඇත. කමිටු යෝජනාවේ අංක 05 යටතේ ප්‍රසම්පාදන කරුවන්ගේ ඉල්ලීම පරිදි ගෙවීම් නොකර තිබියදී බදු අයිතිය අහෝසි කර ඇත. හිඟ මුදල් මේ වන තුරු අය කර නැත.
- 2016.08.28 දින නැවත ටෙන්ඩර් කැඳවා ඇත. නැවත කීමනි මුදල රු 2500.00ක් හා මාසික කුලී මුදල රු 500.00බැගින් අය කිරීම සඳහා කටයුතු කර ඇත 2016.09.07 දින ටෙන්ඩර් කැඳවා භාරගෙන ඇත. එම කඩ කාමර තුන සඳහා අයදුම්පත්‍ර 03 ක් නිකුත් කර ඇත. එම අයදුම්කරුවන්
- 01. ඒ එම් තරිඳු ලක්ෂිත අත්තනායක මයා
- 02.වයි එම් ගුණවර්ධන
- ඒ එම් සුදුනිලමේ අත්තනායක
- වෙනත් ප්‍රසම්පාදන කරුවන් ඉදිරිපත්නොවු නිසා ප්‍රසම්පාදන මණ්ඩලය මෙම තිදෙනාට කඩ ලබා දීමට තීරණය කර 2016.09.14 දින ලිපි යවා 2016.09.26 ගිවිසුම් අත්සන් කර ඇත. එහි ගිවිසුම් කාලය 2016.09.26 සිට 2019.09.26 දක්වා වසර 03 කි.
- මෙම කඩ කාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කුලී මුදල රු 2500.00 ක් ලෙස තක්සේරු කර ඇත. මෙම මුදල 2020.10.01 සිට අය කළ යුතු වුවත් සභාව විසින් තීරණය කර තක්සේරු මුදල සංශෝධනය කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කළ නමුත් කුලී මුදල සංශෝධනය කළ නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දැන්වීම නිසා 2020.10.01 දින සිට රු 2500.00 ක කුලී මුදලක් ගෙවිය යුතු බව බදුකරුවන් දැනුවත් කර ඇත.
- නමුත් නිසි පරිදි කුලී මුදල් නොගෙවීම නිසා කඩ කාමර 2021.12.03 දින මුද්‍රා තබන ලදී.

මෙම කඩ කාමර සඳහා අය වීමට ඇති කුලී මුදල

| කඩ කාමරය | හිඟ කාලය | හිඟ මුදල |
|---|---|---|
| අංක 01 කඩ කාමරය | 2021 ජනවාරි සිට 2021 නොවැම්බර් | 21666.67 |
| අංක 02කඩ කාමරය | 2021 ජනවාරි සිට 2021 නොවැම්බර් | 21666.67 |
| අංක 03 කඩ කාමරය | 2021 ජනවාරි සිට 2021 නොවැම්බර් | 21666.67 |

එබැවින් හිඟ කුලී මුදල අය කර ගැනීමත් ඒ පිළිබඳ සාකච්ඡා කොට තීරණ ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉහත වාර්තාවේ අන්තර්ගත කරුණු පිළිබඳව වැඩි දුර සාකච්ඡා කරමින්, ගරු මන්ත්‍රී ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා අසනීප තත්වයෙන් පෙලෙන නිසාත් මෙම දොඩම්ගොල්ල කඩකාමර 03 පිහිටා ඇත්තේ නාගරික ස්ථානයක නොවන නිසා ව්‍යාපාර කටයුතු සාර්ථක නොවන නිසා එම කඩකාමර වසා තැබීමට හේතු විය. එබැවින් මෙම කඩකාමර 03 සඳහා ප්‍රමාද ගාස්තු ලෙස ගෙවීමට ඇති රු 459000.00ක මුදල කපා හැරීම ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමටත් මේ වන විට හිඟ මුදල ලෙස එක් කඩ කාමරයකට ගෙවීමට ඇති රු. 21666.67ක මුදල කඩකාමර 03 සඳහාම ගෙවීමට සිදු වන බවත් ගියවර සභා තීරණය ප්‍රකාරව අවුරුදු 30කට මෙම කඩකාමර බදු දීමටත් අවුරුදු තුනෙන් තුනට ගිවිසුම් ගත විමටත් කීමනි මුදල ලෙස ලක්ෂ 05ක මුදලක් තීරණය කල අතර එම තීරණ කළ ආකාරයෙන්ම පවත්වාගෙන යාමට සුදුසු බව සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා අසනීප තත්වයෙන් පෙලෙන නිසාත් මෙම දොඩම්ගොල්ල කඩකාමර 03 පිහිටා ඇත්තේ නාගරික නොවන නිසා ව්‍යාපාර කටයුතු නොවන නිසාත් එම කඩකාමර වසා තැබීමට හේතු විය. එබැවින් මෙම කඩකාමර 03 සඳහා ප්‍රමාද ගාස්තු ලෙස ගෙවීමට ඇති රු 459000.00ක මුදල කපා හැර ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමටත් මේ වන විට හිඟ මුදල ලෙස එක් කඩ කාමරයකට ගෙවීමට ඇති රු. 21666.67ක මුදල කඩකාමර 03 සඳහාම ගෙවීමට සිදු වන බවත් ගියවර සභා තීරණය ප්‍රකාරව අවුරුදු 30කට මෙම කඩකාමර බදු දීමටත් කීමනි මුදල ලෙස ලක්ෂ 05ක මුදලක් තීරණය කල අතර එම තීරණ කළ ආකාරයෙන්ම පවත්වාගෙන යාම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.17. ස්ථිර වෙළඳකුටියක් ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල,කවුඩැල්ල ලිපිනයෙහි පදිංචි ඩී.එම්. මහේෂ් ප්‍රේමවංශ යන අය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපස ස්ථිර වෙළඳ කුටියක් ඉල්ලමින් ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් එය මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ස්ථිර වෙළඳ කුටියක් ලබා දීමට ස්ථානයක් නොමැති බැවින් එය ලබා දීමට නොහැකි බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ස්ථිර වෙළඳ කුටියක් ලබා දීමට ස්ථානයක් නොමැති බැවින් එය ලබා දීමට නොහැකි බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.18. බිබිල බස් නැවතුම්පලෙහි කඩකාමරයක් ලබා ගැනීම සම්බන්ධවයි.

බිබිල,දොඩම්ගොල්ල ලිපිනයෙහි පදිංචි ආර්.එම්.අනුර ජගත් බංඩාර යන අය විසින් බස් නැවතුම්පලෙහි දෙවැනි ගොඩනැගිල්ලෙහි මැද හරියෙහි කඩකාමරයක් තමන්ගේ වියදමින් ඉදිකිරීමට හෝ සභාව මඟින් ඉදිකර මාසික ගාස්තුවක් අයකර ඔහුට එය ලබා දෙන ලෙස ඉල්ලමින් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර කීමනි මුදලක් හා මාසික කුලියක් තීරණය කර එය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

නිවැරදිවම වෙළදාම් කරන වෙළඳුන් තෝරා ගෙන ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ බස් නැවතුම්පලේ පඩිපෙල් යට කවුළුවල ඔවුන්ගේ වියදමින්ම පොඩි කඩකාමර සකස් කරවීමටත් එම ස්ථානවල කැලි කසල දැමීම, ඉරිඟු පිච්චීම හා තැම්බීම, සතුන් ලැඟුම් ගැනීම මෙන්ම විවිධ අකටයුතුකම් සිදු වීම හේතුවෙන් එම ස්ථාන තාවකාලික ගිවිසුමක් මත ලබා දීමටත් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරන තෙක් මාසික කුලිය වර්ග අඩි 40ට අඩු බිම්

ප්‍රමාණ සඳහා රු.1,500.00ක් හා වර්ග අඩි 40-80ත් අතර බිම් ප්‍රමාණ සඳහා රු.3,000.00ක් ලෙස මාසික කුලියක් අය කිරිම සුදුසු බවත් කීමනි මුදල ලෙස වර්ග අඩි 40ට අඩු බිම් ප්‍රමාණ සඳහා රු.30,000.00ක් හා වර්ග අඩි 40-80ත් අතර බිම් ප්‍රමාණ සඳහා රු.50,000.00ක් සුදුසු බවට  සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රි එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

නිවැරදිවම වෙළදාම් කරන වෙළදුන් තෝරා ගෙන ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ බස් නැවතුම්පලේ පඩිපෙල් යට කවුළුවල ඔවුන්ගේ වියදමින්ම පොඩි කඩකාමර සකස් කරවීමටත් එම ස්ථානවල කැලි කසල දැමීම, ඉරිඟු පිච්චීම හා තැම්බීම, සතුන් ලැගුම් ගැනීම මෙන්ම විවිධ අකටයුතුකම් සිදු වීම හේතුවෙන් එම ස්ථාන තාවකාලික ගිවිසුමක් මත ලබා දීමටත් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරන තෙක් මාසික කුලිය වර්ග අඩි 40ට අඩු බිම් ප්‍රමාණ සඳහා රු.1,500.00ක් හා වර්ග අඩි 40-80ත් අතර බිම් ප්‍රමාණ සඳහා රු.3,000.00ක් ලෙස මාසික කුලියක් අය කිරිම සුදුසු බවත් කීමනි මුදල ලෙස වර්ග අඩි 40ට අඩු බිම් ප්‍රමාණ සඳහා රු.30,000.00ක් හා වර්ග අඩි 40-80ත් අතර බිම් ප්‍රමාණ සඳහා රු.50,000.00ක් සුදුසු බවට  තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.19. ලංකා සතොස අලෙවිසැල තුල යෝජිත මත්පැන් හලට සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ලිපියක් ලබා ගැනීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබන බිබිල ලංකා සතොස අලෙවිසැල තුල රජයේ නීති රීති වලට අනුගතව ඉදි කිරීමට යෝජිත මත්පැන් හල සඳහා ප්‍රාදේශීය සභාවේ කිසිදු විරුද්ධත්වයක් නොමැති බව පවසා ලිඛිත ලියවිල්ලක් ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී ප්‍රමිතියකින් යුතු රටබීම පාරිභෝගිකයින්ට ලබා දීමට හැකි වීම නිසා සතොස තුළ එය දැමීම සුදුසු බවත්  එහි දී ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය එයට පෞද්ගලිකව විරුද්ධත්වය ප්‍රකාශ කළ අතර සෙසු මන්ත්‍රීවරුන් එයට කැමැත්ත දන්වමින් තවදුරටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රි එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ප්‍රමිතියකින් යුතු රටබීම පාරිභෝගිකයින්ට ලබා දීමට හැකි වීම නිසා සතොස තුළ එය දැමීම සුදුසු බව තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සඳහා මන්ත්‍රී මණ්ඩලයේ බහුතර එකඟතාවය හිමිවූයෙන් යෝජනාව බහුතරයේ කැමැත්තෙන් සභා සම්මත විය.

## 05.01.20. බිබිල සති පොල බදු මුදල් ගෙවීම සම්බන්ධවයි.

බිබිල,කිවුලපිටලන්ද, අංක 91 ලිපිනයෙහි පදිංචි ඊ.ඩබ්.කැඑම් සුරංග යන අය විසින් 2021 වර්ෂය සඳහා බිබිල සති පොල බදු ගෙන ඇති අතර එය 2021 අගෝස්තු හා සැප්තැම්බර් මාසයන්හි කොවිඩ් වසංගතය හේතුවෙන් වසා තිබූ බැවින් එම මාසයන් සඳහා බදු මුදල් නිදහස් කර දෙන ලෙස ඉල්ලමින් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර එය සභා තීරණ ප්‍රකාරව ගැලපේ නම් පමණක් නිදහස් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.21. බිබිල පොදු වෙළඳපොළ සංකීර්ණයේ අංක F 07 හා 09 දරණ කඩ කාමරයේ නම් මාරු කිරිම සම්බන්ධවයි.

බිබිල, නන්නපුරාව, කෝන්ගොල්ල, අලකොලමණ්ඩිය යන ලිපිනයේ පදිංචි පී.බී.සුනිල් ගුණවර්ධන යන අය විසින් බිබිල පොදු වෙළඳපල සංකීර්ණයේ පිහිටි අංක 07 දරණ කඩකාමරය බිබිල, නන්නපුරාව, අංක 01 ලිපිනයේ පදිංචි ඩී.එම්. අමිල ප්‍රභාෂ්වර යන අය නමින් නම් මාරු කොට පවරා දීමටත් බිබිල , මහියංගනපාර ,1 කණුව යන ලිපිනයේ පදිංචි රම්‍ය පියසීලි ලොකුගම්හේවා යන අය විසින් බිබිල පොදු වෙළඳපල සංකීර්ණයේ පිහිටි අංක 09 දරණ කඩකාමරය බිබිල, නන්නපුරාව, අංක 01 ලිපිනයේ පදිංචි ඩී.එම්. සුනිල් රත්නායක යන අය නමින් නම් මාරු කොට පවරා දීමටත් අවශ්‍ය කටයුතු කර දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර මෙම කඩකාමර දෙකම පැවරුම් ගාස්තුවකට යටත්ව පවරා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී පැවරුම් ගාස්තුව ලෙස රු.100,000.00ක මුදලක් තීරණය කළ අතර ලක්ෂ දහයෙන් ලක්ෂ තුන හමාරක් ගෙවා ඇති අතර ඉතිරි මුදල අළුතින් පවරන පුද්ගලයාට ගෙවිමට සිදු වන බවට  සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී . ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පැවරුම් ගාස්තුව ලෙස රු.100,000.00ක මුදලක් තීරණය කළ අතර ලක්ෂ දහයෙන් ලක්ෂ තුන හමාරක් ගෙවා ඇති අතර ඉතිරි මුදල් අළුතින් පවරන පුද්ගලයා ගෙවිම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.22. ඇතුන්දැමුවාව මාර්ගයේ මීටර් දෙසීයයක් පමණ කොන්ක්‍රීට් කිරීම.

බිබිල,අරවාකුඹුර, ඇතුන්දැමුවාව ලිපිනයේ පදිංචි ඇතුම්දමුවාව කදුකර අවමංගලාධාර සමිතිය විසින් ඇතුන්දැමුවාව මාර්ගයේ පාසලට ආසන්න මීටර් 200ක පමණ කොටස ඉතා දැඩිලෙස අබලන්ව ඇති නිසා මෙම කොටස කොන්ක්‍රීට් කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇති අතර එම කටයුත්ත ඉටු කර දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී ඇස්තමේන්තුව සකස් කර අරමුදල් ලැබෙන ආකාරයට සකස් කර දිම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඇස්තමේන්තුව සකස් කර අරමුදල් ලැබෙන ආකාරයට සකස් කර දිම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.23. ඇස්තමේන්තු අනුමත කිරීම.

සභා බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා සකස් කර ඇති පහත ඇස්තමේන්තු අනුමත කිරිම සුදුසු බවත් සභාවේ අරමුදල් ප්‍රමාණය සලකා බලා ඉදිකිරිම් කටයුතු සඳහා ගිවිසුම් ගත වීමට සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේනතු මුදල (රු) |
|---|---|---|
| 01 | ඇතුන්දමුවාව වසන්ත මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 500,000.00 |
| 02 | ඉදිලන්ද මාර්ගයේ බෝක්කුවක් ඉදිකිරීම. | 450,000.00 |
| 03 | කිවුලපිටලන්ද බොකාගොන්න මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 500,000.00 |
| 04 | කනුල්වෙල ඇල පාර සංවර්ධනය කිරීම. | 400,000.00 |
| 05 | පිටකුඹුර පින්නලන්ද තොටුපල මාර්ගය කොන්ක්‍රීට් කැට | 450,000.00 |

| | | |
|---|---|---|
| | ගල් අල්ලා අලුත්වැඩියා කිරීම. | |
| 06 | කොටගම සුසාන භූමිය මාර්ගය සංවර්ධනය කිරීම. | 598,000.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.24. උඩමල්ලැහැව ඇටඹගස් හන්දිය අනතුරුදායක බුරුත ගස කපා ඉවත් කිරීමට අනුමැතිය ලබා දීම.

2020 ඔක්තෝම්බර් මස 20 වන දින පැවති මාසික සභා රැස්වීමේ යෝජනා අංක 08.03 මඟින් ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් උඩමල්ලැහැව ඉනවැල්ල මාර්ගයේ ඇටඹගස් හංදියේ පිහිටි අනතුරුදායක බුරුත ගස ඉවත් කර දෙන ලෙස ඉල්ලා ඇත.ඒ අනුව ප්‍රාදේශීය ලේකම් මඟින් රාජ්‍ය දැව සංස්ථාවට දන්වා වසරක පමණ කාලයක් ගත වී ඇති නමුත් එම ගස ඉවත් කිරිමට නොහැකි වී ඇත.

එම ගස ඉවත් නොකිරීමෙන් මාර්ගයේ ගමන් කරන ජනතාවගේ ජීවිතවලට හා දේපලවලට සිදුවිය හැකි අවධානම පිළිබඳව ප්‍රාදේශීය සභාවට නිතර නිතර ලිපි ඉදිරිපත්ව ඇත.ඒ අනුව සලකා බලා මෙම අනතුරුදායක බුරුත ගස සභා අරමුදලින් කපා ඉවත් කිරීමටත් මෙය හදිසි කටයුත්තක් බැවින් ඒ සඳහා මිල ගණන් කැඳවා ඇති අතර අඩුම මිල ගණන් ඉදිරිපත් කර ඇති මඩවල,කොටගම,බිබිල ලිපිනයේ පදිංචි ඒ.එම්.චමින්ද ගුණවර්ධන මහතාගේ මිල ගණන් යටතේ රු.36,000.00ක මුදලකට මෙම ගස කපා ඉවත් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 6. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.

වාර්තා කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

2021 දෙසැම්බර් මාසයට අදාල ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07)සභාවේ දැනගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

<u>ආදායම්</u>

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | **- රු. 14,456,895.88** |
| **ප්‍රාග්ධන ලැබීම්** | - රු. - |
| වෙනත් ලැබීම් | - රු. 944,697.09 |
| මුළු ලැබීම් | **- රු. 15,401,592.97** |

<u>වියදම්</u>

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 9,413,430.67 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 7,291,715.64 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු 3,702,737.92 |
| ආයෝජන | - රු. - |
| මුළු වියදම් | - රු **20,407,884.23** |

**2021.12.31 දිනට තවදුරටත් හිඟ ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 5,117,556.97 |
| අක්කර බදු | - රු. 128.44 |
| කඩ කුලී | - රු. 808,976.69 |
| මාලු කඩ/මස් කඩ | - රු. 2,123,129.00 |
| ජල ගාස්තු | - රු 462,414.96 |
| සතිපොළ | - රු 13,616.80 |
| ටෙන්ඩර් මඟින් කුලියටදීම් | - රු. 17,000.00 |
| එකතුව | - රු 8,542,822.86 |

ඉදිරිපත් කර ඇති ඉහත ආදායම් හා වියදම් වාර්තා ගරු මන්ත්‍රී එම්.ඒ.උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම ආදායම් වියදම් හා හිඟ වාර්තා සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.

ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පලකළෙන් ආදායම් වියදම් හා හිඟ ආදායම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

## 08.වෙනත් කරුණු

## 08.01. මන්ත්‍රීවරුන් නිවාඩු බව දැන්වීම.

ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා වෛද්‍ය හේතුන් මත හා ජේ.ඒ. අමාලි කාංචනා ජයලත් මැතිතුමිය කථානායකවරයාගේ ආරාධනාවක් මත පැෆ්රල් සංවිධානය විසින් සංවිධානය කරන ලද "වෙනසකට මගක්" රැස්වීමකට සහභාගි වූ නිසා මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇති අතර ඒ සඳහා නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා</u>**

වෙනත් කරුණු යටතේ අදහස් දක්වන්නේ නම් එදිනට අදහස් දක්වන කාරණාව පිළිබඳව සභාව පැවැත්වීමට දින හතකට පෙර ලේකම්තුමා දැනුවත් කර න්‍යාය පත්‍රයට එය ඇතුලත්

කරන ලෙස කොමසාරිස්තුමා විසින් ඉල්ලීමක් කර ඇති බැවින් ඒ ආකාරයෙන් කටයුතු කරන ලෙස සභාවට දන්වන ලදී.

මීළඟ මාසික සභාව 2022 පෙබරවාරි මස 22 වන අඟහරුවාදා පෙරවරු 9.30ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවැත් වීමට තීරණය කරමින් සභාවේ වැඩකටයුතු අවසන් කරන ලදී.

ජී.ජී.ආර්. සිල්වා,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත්

01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.

02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.

03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි.